# ඕටිසම් දරුවන්ගේ භාෂා හැකියාව වර්ධනය කිරීමට රැකබලාගන්නන් සිදුකරන සංගීත ප්‍රතිකාරයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*පී.එස්. නේෂලා [1], ආර්.එම්.ජී. කරුණාරත්න [2]*

ඕටිසම් යනු සංවර්ධන අක්‍රමතාවයක් වන අතර,එහිදී ප්‍රධාන තර්ජනයට ලක්වන සංවර්ධන ක්ෂේත්‍රයක් ලෙස භාෂා වර්ධනය සැලකිය හැක. ඕටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කිරීම අසීරු කාර්යයක් වන අතර භාෂාව වර්ධනයට ඔවුන්ගේ රුචිකත්වයට ගැලපෙන භාෂා මැදිහත්කරණ ක්‍රමවේදයක අත්‍යවශ්‍යතාවය ඕටිසම් දරුවන් බහුලව අත්විඳින ගැටලුවකි. මැදිහත්කරණ ක්‍රමවේදයක් ලෙස රැකබලාගන්නන් හා සිදුකරන සංගීත ප්‍රතිකාරයේ බලපෑම ඕටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කෙරෙහි බලපෑමක් සිදු කරන්නේද යන්න හඳුනාගැනීම මෙම අධ්‍යයනය තුළින් සිදුකරයි.අධ්‍යනයේ අරමුණු ලෙස ඕටිසම් භාෂාව වර්ධනය කෙරෙහි සංගීත ප්‍රතිකාරයේ බලපෑමක් පවතින්නේද යන්න හඳුනාගැනීම,සංගීත ප්‍රතිකාරයේ බලපෑම ස්ත්‍රී පුරුෂ හා වයස් මට්ටම් අනුව ඔවුන්ගේ භාෂාව වර්ධනයට කුමන ආකාරයේ බලපෑමක් සිදු සිදු සිදුකරන්නේද හඳුනා ගැනීම,භාෂා ග්‍රහණය ප්‍රකාශිත භාෂාව වර්ධනය කෙරෙහි කුමන ආකාරයේ සහසම්බන්ධතාවයක් පවතින්නේ ද යන්න හඳුනාගැනීම උප අරමුණු වේ.පහසු නියැදීමේ ක්‍රමය මත  පදනම්ව ගම්පහ දිස්ත්‍රික්කයේ විශේෂ පාසලක් හා කළුබෝවිල රෝහල අනුබද්ධිත ආබාධ පුහුණු මධ්‍යස්ථානය ආශ්‍රිතව වයස 3-7 ඕටිසම් දරුවන් 50 දෙනෙකු සම්බන්ධ කරගත් අතර එහිදී සහභාගිවන ඕටිසම් දරුවන්ගේ දෙමාපියන්ට සංගීත ප්‍රතිකාරය සිදු කරන ආකාරය පිළිබඳ තොරතුරු ලබා දී එම දරුවන්ට දෙමාපියන් හා එකතුව මාස දෙකක සංගීත ප්‍රතිකාරය පුහුණු වීමට අවකාශ සැලසිය. ප්‍රතිකාරය ලබාදීමට පෙර, දෙමාපියන් හා සංගීත ප්‍රතිකාරය පුහුණුව මාස දෙකකට පසු, භාෂා සංවර්ධනය මැනීම සඳහා ආඛ්‍යාන මෙවලමක් භාවිතා කරන ලදි. සංගීත ප්‍රතිකාරයේ ගීතවල වචන හයක් සුවිශේෂී අවධානයකින් යුක්තව ඉගැන්වීම සිදු කරන අතර, ආඛ්‍යාත මෙවලම හරහා භාෂා සංවර්ධනය ලෙස මැනීම සිදුවූයේ ඉහත අවධාරණය කළ සුවිශේෂ වචන වේ. දත්ත විශ්ලේෂණය SPSS සංඛ්‍යාන විද්‍යාත්මක මෘදුකාංගය යොදාගත් අතර, සංගීත ප්‍රතිකාරයට පෙර හා පසු භාෂා සංවර්ධනයේ වෙනසක් ඇති ද යන්න අධ්‍යයනය කිරීම හා සංගීත ප්‍රතිකාරයෙන් පසුව වයස් කාණ්ඩයන් අනුව භාෂා සංවර්ධනයේ වෙනසක් පවතින්නේ ද යන්න අධ්‍යයනය කිරීමට Paired-Samples T-Test යොදා ගත් අතර, එහිදී සංගීත ප්‍රතිකාරයට පෙර හා පසුව භාෂා පරීක්ෂණය හිදී හා සංගීත ප්‍රතිකාරයෙන් පසු එකිනෙකා වයස් කාණ්ඩයන් අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු වෙනසක් හඳුනා ගන්නා ලදි. සංගීත ප්‍රතිකාරයෙන් පසු ස්ත්‍රී පුරුෂ අනුව භාෂාව වර්ධනයේ වෙනසක් පවතින්නේද යන්න අධ්‍යයනය කිරීමට Independent Sample T-Test යොදාගත් අතර, ඒ අනුව සංගීත ප්‍රතිකාරයෙන් පසුව ස්ත්‍රී පුරුෂ අනුව භාෂා සංවර්ධනයේ සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු වෙනසක් හඳුනා ගන්නා ලදී. භාෂා ග්‍රහණය ප්‍රකාශිත භාෂාව වර්ධනය කෙරෙහි බලපෑම අධ්‍යයනයට පියර්සන් සහ සම්බන්ධතා සංගුණකය භාවිත කර අතර එහිදී සහ සම්බන්ධතාවයක් පවතින බවට හඳුනා ගනී. ඔටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කෙරෙහි සාර්ථක මැදිහත්කරණ ක්‍රමවේදයක් ලෙස මෙම ප්‍රතිකාරය භාවිතා කළ හැකි බවත්, ප්‍රතිකාරයේ ගුණාත්මක බව තවදුරටත් වර්ධනය කරමින් ඕටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කෙරෙහි යොදා ගැනීම ඔවුන්ට මහත් පිටුවහලක් වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** ඕටිසම්, භාෂාව වර්ධනය, රැකබලාගන්නන්, සංගීත ප්‍රතිකාරය

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. neshalasanduni@gmail.com

[2] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.